# ක්‍රීඩා සමාජ සඳහා ව්‍යවස්ථා මාලාව

## ව්‍යවස්ථා මාලාව:

දකුණු පලාතේ ක්‍රීඩා සංවර්ධනය සඳහා ඇපකැප වූ ජීවිත හැඟීම් වලින් පරිපූර්ණ, විනය ගරුක ක්‍රියාශීලී, උද්‍යෝගීමත් යෞවන නායකයින් ක්‍රීඩාව තුලින් බිහි කිරීම උදාරතර අභිලාෂය වේ.

ක්‍රීඩාවේ ඇති උතුම් ගුනාංගය වන ජය පරාජය ඉවසීමේ හැකියාව සහ අභියෝගයකට මුහුණදී එඩිතරව තම අභිමතාර්ථය කරා පියනැගීමේ සහ ස්වයං තීරන ගැනීමේ ඇති හැකියාව යන කරුණු කෙරේ මෙහිදී විශේෂ අවධානය යොමුකර වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ඇත. මෙම කරුණු ඉටුකර ගැනීම සඳහා නිශ්චිත දෘෂ්ඨියකින් කටයුතු කරන නිවැරදි මඟපෙන්වන නියමුවකු වශයෙන් ක්‍රීඩා සමාජ ව්‍යවස්ථාව තම කාර්යය ඉටු කරනු ඇත.

## (01). සංවිධාන ව්‍යුහය:

I. මෙහි ප්‍රාථමික සංවිධානය " ක්‍රීඩා සමාජය " යන්නයි. ග්‍රාම සේවා වසමක ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සමාජ කීපයක් තිබිය හැක.

II. දෙවන ස්ථරය වශයෙන් සලකනු ලබන්නේ ක්‍රීඩා සමාජ ප්‍රාදේශීය මණ්ඩල යයි. මෙය ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශ මට්ටමින් ස්ථාපනය වන සංවිධානයයි.

III. තෙවන ස්ථරය වශයෙන් සලකනු ලබන්නේ දිස්ත්‍රික් මට්ටමෙන් සංවිධානය වන ක්‍රීඩා සමාජ දිස්ත්‍රික් මණ්ඩලයයි.

IV. හතරවන ස්ථරය වශයෙන් සලකනු ලබන්නේ පලාත් මට්ටමේ පිහිටුවන ලබන ක්‍රීඩා සමාජ පළාත් මණ්ඩලයයි.

## (02) සංවිධාන ප්‍රතිපත්ති:

I. ක්‍රීඩා සමාජය යනුවෙන් හඳුන්වන ප්‍රාථමික සංවිධානයේ සිට පළාත් මට්ටමේ පිහිටුවන පළාත් මණ්ඩලය දක්වා නියෝජිතයින් පත් කිරීම, සිදු කල යුතුය.

II. ඒ ඒ මණ්ඩලවල සංවිධාන සාමූහික නායකත්වය පිළි ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට අනුකූල ලෙස නිල සාමාජිකයන් හැර සෙසු නිලධාරීන් තෝරා ගැනීම කළ යුතුය.

III. සෑම සාමාජිකයෙක්ම තමා අයත් සංවිධානයේ බහුතරය ගනු ලබන තීරණ වලට අනුකූලව කටයුතු කිරීමට බැඳී ඇත. සෑම පහල සංවිධානයක්ම ඉහල සංවිධානයට යටත් විය යුතුය.

IV. ප්‍රාථමික සංවිධානය වන ක්‍රීඩාවේ යෙදෙන්නන්ගේ සමාජයේ සාමාජිකත්වය නොලැබූවෙකුට ඉහල මණ්ඩලවල සාමාජිකත්වය ලබාගත නොහැකිය. මෙය පත්කළ නියෝජිතයින් වෙනුවෙන් වලංගු නොවේ.

V. සියළුම සාමාජිකයන් හා සංවිධාන ව්‍යවස්ථාවේ දැක්වෙන විනය නීතිරීති පිළිපැදිය යුතුය.

(..2.

vi. මෙකී ක්‍රීඩා සමාජයන් සහ ක්‍රීඩා කටයුතු භාර අමාත්‍යාංශය, අතර සෘජු සම්බන්ධතාවය තහවුරු විය යුතුය. ඒ සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය භාර ලේකම්වරයා විසින් නිලධාරියෙකු හෝ නිලධාරී මණ්ඩලයක් පත් කරනු ඇත.

vii. සෑම සංවිධානයක්ම ක්‍රියාශීලීත්වය, උද්යෝගය හා සමගිය යන ප්‍රතිපත්තීන් පිහිටා ක්‍රියාකළ යුතුය.

(03) අධිකාරිය:

සියළුම ක්‍රීඩා සමාජ ක්‍රීඩා කටයුතු භාර අමාත්‍යාංශයේ අධිකාරී බලයට යටත්ව කටයුතු කරන ස්වේච්ඡා සංවිධානයක් වේ.

04. බලතල:

ක්‍රීඩා කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් පත් කරනු ලබන නිලධාරියෙකු හැකිනම් නිලධාරී මණ්ඩලයට පහත දැක්වෙන පරිදි බලතල පැවරේ.

i. ප්‍රාථමික සංවිධානය ලෙස ග්‍රාම සේවක කොට්ඨාශ මට්ටමින් ක්‍රීඩා සමාජ පිහිටුවීම, ඒවා පාලනය, තහනම් කිරීම හෝ විසිරුවා හැරීම.

ii. ජාතික මට්ටමින් ප්‍රධාන කාර්යාලයත්, පළාත් මට්ටමින් පළාත් කාර්යාල, දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය මට්ටමින් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම හා පවත්වාගෙන යාම.

iii. ක්‍රීඩා කරන්නන්ගේ සමාජ වලට අවශ්‍ය වංචල හෝ නිශ්චල දේපල මිලයට ගැනීම බද්දට හෝ කුලියට ගැනීම සහ ඒවා විකිණීම.

iv. ගාස්තු ඉල්ලීම හෝ භාර ගැනීම.

v. ශිෂ්‍යත්ව, පදක්කම් හෝ වෙනත් තිළිණ නිර්මාණය කිරීම.

vi. විදේශ රටවල් හෝ සංවිධාන විසින් ක්‍රීඩා කරන්නන්ගේ සමාජ වලට ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව, තෑගි, තිළිණ, චාරිකා, සම්මන්ත්‍රණ, මුදල් සහ ද්‍රව්‍යමය ආධාර භාර ගැනීම.

vii. ක්‍රීඩා සංවර්ධනයට අදාල පාඨමාලා, ව්‍යාපෘති සහ මධ්‍යස්ථාන ආරම්භ කර පවත්වාගෙන යාම.

viii. ක්‍රීඩා කරන්නන්ගේ සමාජ වෙනුවෙන් අරමුදලක් පිහිටුවා පවත්වාගෙන යාම.

ix. ක්‍රීඩා සමාජවල නාමයෙන් සියළුම අධිකරණවල නඩු පැවරීම.

x. ලාංජනයක් සහ මුද්‍රාවක් පවත්වාගෙන යාම සහ අවශ්‍ය පරිදි වෙනස්කර ගැනීම.

xi. එම සංවිධාන ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචි අංක නිකුත් කිරීම.

ක්‍රීඩා කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන නිලධාරියාට හෝ නිලධාරී මණ්ඩලයට පහත සඳහන් වැරදි කරණකොට ගෙන ඕනෑම මට්ටමක ක්‍රීඩා කරන්නන්ගේ සමාජ විසිරුවා හැරීමට බලය ඇත.

(අ) අකාර්යක්ෂමතාවය හා නොමනා පාලනය.

(ආ) සිය ව්‍යවස්ථාවෙන් නියම කරනු ලැබූ කාර්යයන් ඉටු කිරීම නිරතුරුවම පැහැර

(ඇ) තම පරමාර්ථ හා අරමුණුවලට පටහැනිව ක්‍රියා කිරීම.

(ඈ) එක් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් හෝ ක්‍රීඩා කරන්නන්ගේ සමාජයක් තම තමන්ගේ පෞද්ගලික අපේක්ෂාවන් සඳහා ක්‍රීඩා කරන්නන්ගේ සමාජය අනිසිලෙස පාවිච්චි කිරීම.

(ඉ) ක්‍රීඩා කරන්නන්ගේ සමාජයේ නිලධාරීන්ට අපකීර්තිය සලසන ක්‍රියාවන්හි නිරතවීම.

## (05) ක්‍රීඩා කරන්නන්ගේ සමාජවල අරමුණු / පරමාර්ථ:

I. ජයපරාජය දෙකෙහිම එකසේ නොසැලෙන මනසකින් යුක්තවූ ක්‍රීඩාශීලී ශාරීරික හා මානසික අතින් මනා සෞඛ්‍යයකින් යුක්ත වූ පූර්ණ පෞරුෂයක් ඇති ක්‍රීඩා පරම්පරාවක් බිහි කිරීම ප්‍රධාන අරමුණකි.

II. ක්‍රීඩකයින්ගේ සහජ ක්‍රීඩා කුසලතා හඳුනා ගැනීම සහ එම හැකියාවන් වර්ධනය කර ගැනීමත් ප්‍රදර්ශනයටත් ඉඩ ප්‍රස්ථා සලසාදීම.

III. ජාති, කුල, ආගම් දේශපාලන යනාදි කිසිදු භේදයකින් තොරව ක්‍රීඩාවට ලැදි සියළුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් එකම සංවිධානයක් තුළ ඒකරාශී කිරීම.

IV. සම්ප්‍රදායික ප්‍රාචීන ක්‍රීඩා අංග පිළිබඳ නූතන ක්‍රීඩක පරපුර තුල ඇති දැනුම සහ අවබෝධය වර්ධනය කිරීම සහ නූතන ක්‍රීඩක පරපුර තුලින් ක්‍රමයෙන් ඈත්වී යමින් පවතින එම අංග කෙරෙහි ක්‍රීඩක සිත් සතන් යොමු කිරීම.

V. සම්ප්‍රදායික ගැමි ක්‍රීඩා සහ නූතනයේ ප්‍රචලිත ක්‍රීඩා පිළිබඳව අවශ්‍ය අධ්‍යාපනයක්, පුහුණුවක් ලබාදී එම අංග ක්‍රීඩක පරපුර තුල ප්‍රචලිත කිරීම.

VI. අවශ්‍ය සෑම අවස්ථාවකදීම ක්‍රීඩා පිළිබඳව මාර්ගෝපදේශ හා උපදේශක සේවා ලබාදීම.

VII. ක්‍රීඩක ක්‍රීඩිකාවන් තුළ ක්‍රීඩාව පිළිබඳව ඇති දුර්මතයන් ඉවත් කර වෘත්තීය ක්‍රියාශීලීව හා මනා චිත්තයකින් යුක්තව තරඟ කළ හැකි ජාතික ක්‍රීඩක පරපුරක් ගොඩනැගීම.

VIII. අන්තර් ජාතික වශයෙන් විවිධ රටවල ඇති ක්‍රීඩා සංවිධාන සමග මිත්‍ර සබඳතා පැවැත්වීම.

IX. ක්‍රීඩාවට අදාල ඓතිහාසික තොරතුරු ඒකරාශී කිරීම, පර්යේෂණ කිරීම, පොත්පත් සඟරා මුද්‍රණය හා බෙදාහැරීම පිළිබඳව ක්‍රීඩකයන් උනන්දු කරවීම.

X. දිවයිනේ පිහිටුවා ඇති වෙනත් ස්වේච්ඡා සංවිධාන සමග සමීප සම්බන්ධතාවයක් සහ විශ්වාසය ගොඩනැගීම සඳහා වූ විවිධ වැඩ සටහන් යනාදිය සංවිධානය කිරීම.

XI. දිවයිනේ පිහිටුවා ඇති වෙනත් ස්වේච්ඡා සංවිධාන සමග සහයෝගිතාවයක් ඇතිවන ආකාරයේ ඒකාබද්ධ ක්‍රීඩා වැඩ සටහන් මෙහෙයවීම.

XII. ක්‍රීඩාවේ උන්නතිය සඳහා වන ප්‍රතිපත්ති සඳහා වන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ප්‍රබල සංවිධානයක්.

## (06) වැඩ කටයුතු:

ක්‍රීඩා සමාජවල අරමුණු සපුරා ගැනීමට ඉවහල් වන්නා වූ ක්‍රම සම්පාදනය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, ඇගයීම සහ පසුවිපරම් කටයුතු මෙයට අදාල වේ.

..4.

(07) ක්‍රීඩා සමාජවල සාමාජිකත්වය සඳහා සුදුසුකම් :

මෙහි සාමාජිකත්වය අපේක්ෂා කරන්නවුන් විසින් පහත සඳහන් මූලික සුදුසුකම් ලබා සිටිය යුතුය.

I. ක්‍රීඩා අමාත්‍යාංශයේ ලියාපදිංචි කරන ලද ක්‍රීඩා සමාජයක සාමාජිකයෙකු වීම.
II. ක්‍රීඩා සමාජයේ පරමාර්ථ, අරමුණු, ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙලට එකඟවීම.
III. ක්‍රීඩා සමාජයේ තීරණ ක්‍රියාත්මක කිරීමට බැඳී සිටිය යුතුය.
IV. සාමාජික මුදල් නිසි පරිදි ගෙවීම.
V. වයස අදාල නොවේ.
VI. අදාල ක්‍රීඩා සමාජය පිහිටි ග්‍රාම සේවක වසමේ වසර 02 කට ස්ථිර පදිංචියක් තිබිය යුතුයි.

(08) සාමාජික යුතුකම් හා වගකීම් :

ක්‍රීඩා සමාජයේ සෑම සාමාජිකයෙකු විසින්ම පහත සඳහන් යුතුකම් හා වගකීම් ඉටුකළ යුතුය.

I. ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්ති වැඩ පිළිවෙල හා තීරණ ක්‍රියාත්මක කිරීම.
II. ක්‍රීඩා සමාජයේ ව්‍යවස්ථා මාලාව අනුගමනය කිරීම හා එය ආරක්ෂා කිරීම.
III. ක්‍රීඩා කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන නිලධාරියා හෝ නිලධාරී මණ්ඩලය සහ එහි විවිධ මට්ටම්වලට අයත් මණ්ඩල විසින් නියම කරනු ලබන වැඩ කටයුතු ඉටුකිරීම.
IV. ක්‍රීඩා සමාජවල ගාස්තු නිසි පරිදි ගෙවීම.
V. තමා නියෝජනය වන සමාජයේ හෝ මණ්ඩලයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.
VI. ක්‍රීඩා සමාජවල අරමුණු හා පරමාර්ථවලට අනුකූල වන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

(09) සාමාජික අයිතිවාසිකම් හා වරප්‍රසාද :

ක්‍රීඩා සමාජවල සාමාජිකත්වය ලැබූවෙකුට පහත සඳහන් අයිතිවාසිකම් හා වරප්‍රසාද ඇත.

I. ප්‍රාදේශීය මට්ටමේ සිට පළාත් මණ්ඩලය දක්වා වන නිලතලවලට තරග කිරීම.
II. ප්‍රාදේශීය මණ්ඩලයේ සිට පළාත් මණ්ඩලය දක්වා වූ මණ්ඩලවලට යෝජනා හෝ පැමිණිලි ඉදිරිපත් කිරීම.
III. රැස්වීම් වාරවලදී ඡන්දය පාවිච්චි කිරීම.
IV. තමන්ට විරුද්ධව තිබෙන චෝදනා සම්බන්ධයෙන් අදාල සංවිධාන ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීම.

(10) සාමාජිකත්වය අවලංගුවීම :

ක්‍රීඩා කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් පත් කරන ලද නිලධාරියෙකු හෝ නිලධාරී මණ්ඩලය විසින් පත් කරනු ලැබූ සාමාජිකයින්ගේ හැර අනෙක් සියළුම සාමාජිකයින්ගේ සාමාජිකත්වය පහත සඳහන් කරුණු හේතුකොට ගෙන අවලංගු වේ.

I. නව වර්ෂයට සාමාජිකත්වය අළුත් නොකිරීම, මෙය ක්‍රීඩා සමාජයට හා සාමාජිකයෙටද වලංගුය.

II. ව්‍යවස්ථා මාලාවේ සඳහන් අරමුණු පරමාර්ථවලට පටහැනිව ක්‍රියාකිරීම.
III. මසකට කලින් ඉල්ලා අස්වීම.
IV. මරණය.
V. සිහිවිකල් පුද්ගලයෙකු ලෙස ඔප්පුවීම.
VI. සාමාජික මුදල් පැහැර හැරීම.
VII. ක්‍රීඩා සමාජයේ මහා සභා රැස්වීම් තුනකට පිළිගත නොහැකි හේතූන් මත සහභාගි නොවීම.
VIII. පදිංචි බල ප්‍රදේශය අතහැරයාම.

(11) විනයානුකූල ක්‍රියාමාර්ග:

I. ක්‍රීඩා කරන්නන්ගේ සමාජවල සෑම සාමාජිකයෙක්ම ව්‍යවස්ථාව සහ අනුරූ ව්‍යවස්ථාව පිළිපැදීමට බැඳී සිටී. යම්කිසි මණ්ඩලයක් හෝ ක්‍රීඩා කරන්නන්ගේ සමාජයක් ව්‍යවස්ථාවට පටහැනි අන්දමින් කටයුතු කරන්නේ නම් ඔහුට හෝ ඇයට විරුද්ධව විනයානුකූලව ක්‍රියාමාර්ගයක් ගැනීමට අදාල සංවිධානයන්ට බලය ඇත.
II. අදාල සංවිධානය මගින් පත් කරනු ලබන විනය කමිටුවට විනයානුකූල පරීක්ෂණයක් පවත්වා එහි වාර්තාවක් ක්‍රීඩා සමාජයේ කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පහත සඳහන් දඬුවම් වලින් එකක් හෝ කීපයක් දීමට මහ සභාවට බලය ඇත.

   I. දොස් නැගීම.
   II. තදින් අවවාද කිරීම.
   III. නිලපල වලින් ඉවත්වීම.
   IV. නියමිත කාලයට නිලතල වලට පත් කිරීම තහනම් කිරීම.
   V. සාමාජිකත්වය තහනම් කිරීම හෝ නෙරපීම.

(12) ක්‍රීඩා සමාජවල ඒ ඒ සංවිධානවල ක්‍රියාකාරී ස්වරූපය:

I. මෙයට පදනම් වන්නේ ග්‍රාම සේවා වසමය. එහෙත් එක් ග්‍රාම සේවක වසමක ක්‍රීඩා සමාජ එකකට වඩා පිහිටුවීමට ඉඩකඩ ඇත.
II. නිලධාරීන් ක්‍රීඩා තරගවලට සහභාගිවූ ක්‍රීඩා අංග කෙරේ විශේෂ ලැදියාවක් ඇති අය අතරින් පත්කර ගත යුතුය.
III. මෙම සමාජයක් පිහිටුවීමේදී ප්‍රදේශයේ ක්‍රීඩා නිලධාරී, කරුණ සේවා නිලධාරී හා ග්‍රාම සේවා නිලධාරී යන නිලධාරීන්ගේ සහාය ලබාගත යුතුය.
IV. මෙහි සාමාජිකයින් ප්‍රමාණය නිලධාරීන් ද ඇතුළුව අවම වශයෙන් 30 ක් වත් විය යුතුය.
V. මෙය පිහිටුවන දිනයේදීම එයට සුදුසු නමක් තෝරා ගැනීම කළ යුතුය.
VI. මෙය පිහිටුවා සති දෙකක් ඇතුලත නියමිත ආකෘති පත්‍ර සම්පූර්ණකර අදාල ක්‍රීඩා නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයද සහිතව ක්‍රීඩා කටයුතු භාර අමාත්‍යාංශයේ ලියාපදිංචිය සඳහා යැවිය යුතුය.

6..6.

vii. ක්‍රීඩා සමාජයේ උත්තරීතර මණ්ඩලය මහ සභාව වේ. මහ සභාව සෑම වර්ෂයකම පැවැත්විය යුතුය. (දෙසැම්බර් මාසයේ 31 සිට ජනවාරි 31 )

viii. මහ සභා දෙක් අතර කාලයේදී සමාජයේ එදිනෙදා කටයුතු ගෙනයාම කාරක සභාව කළ යුතුය.

× මහ සභාව කැඳවීමට දින 14 කට පෙර ඒ බව සාමාජිකයන්ට දැනුම්දිය යුතුය.
× මහ සභාවේ සභාපූර්ණය මුළු සාමාජිකත්වයෙන් 1/2 ක් වේ.
× කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සලකා බැලීම හා ඒවා පිළිබඳ තීරණ ගැනීමට මහ සභාවට බලය ඇත.
× ක්‍රීඩා සමාජයේ වැඩ පිළිවෙල තීරණය කිරීම හා සංශෝධනය කිරීමේ බලයද මහ සභාවට තිබේ.
× අයවැය වාර්තා පිළි ගැනීම සහ සාමාජික මුදල තීරණය කිරීමද කළ හැක.
× ව්‍යවස්ථානුකූල විනයානුකූල දඬුවම් තීරණය කළ හැකිය.
× ක්‍රීඩා සමාජය සඳහා පහත සඳහන් නිලධාරීන් වර්ෂ 01 ක කාලයක් සඳහා තෝරා පත්කර ගත හැකිය.

1. සභාපති.
2. උප සභාපති.
3. ලේකම්.
4. උප ලේකම්.
5. භාණ්ඩාගාරික.
6. උපදේශක මණ්ඩලයට සාමාජිකයන් 04 දෙනෙකි.
   1. ක්‍රීඩා නිලධාරී, ග්‍රාම සේවා නිලධාරී හෝ තරුණ සේවා නිලධාරී, ඇතුළුව බල ප්‍රදේශයේ විදුහලක විදුහල්පති, ගුරුවරයෙක් හෝ අදාල අංශය කෙරේ ලැදි අයවලුන්ගෙන් තවත් දෙදෙනෙක් පත්කර ගත යුතුය. අවශ්‍ය නම් අනු කමිටු පිහිටුවා ගත හැකිය. (ක්‍රීඩා අනුව)

## 2 වන කොටස

## ප්‍රාදේශීය ක්‍රීඩා සභා

(5) සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහාම ප්‍රාදේශීය ක්‍රීඩා සභාවක් පිහිටුවිය යුත්තේය.

එහි,

(1) සභාපතිවරයා තත්කාලීන ප්‍රාදේශීය ලේකම්වරයා වන්නේය.

(2) එහි ලේකම් වරයා කොට්ඨාශයේ ක්‍රීඩා නිලධාරියා විය යුත්තේය. ~

ප්‍රාදේශීය ක්‍රීඩා සභාවේ සෙසු සාමාජිකයින් පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතු අතර එම සාමාජිකයන් පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ වරයා විසින් පත් කල යුත්තේය.

අ. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන ක්‍රීඩා විෂය භාර ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.

ආ. අදාල පළාත් පාලන ආයතනවල ලේකම්වරයා හෝ හා කොමසාරිස්වරයා ප්‍රාදේශීය තරුණ සේවා නිලධාරීවරයා.

ඇ. ප්‍රාදේශීය තරුණ සේවා නිලධාරීවරයා.

ඈ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අනුයුක්ත සාර්මික නිලධාරීවරයා.

ඉ. අදාළ ප්‍රාදේශීය සංගම් වලින් නම් කරනු ලබන නියෝජිතයෙකු බැගින්.

ඊ. ක්‍රියාකාරී ක්‍රීඩා සමාජ වලින් නම් කරනු ලබන නියෝජිතයෙකු බැගින්.

## 3 වන කොටස

### දිස්ත්‍රික් ක්‍රීඩා සභා

(06) ………………………… පළාතේ පරිපාලන දිස්ත්‍රික්ක වල ක්‍රීඩා හා ශාරීරික ප්‍රවර්ධනය, සංවර්ධනය හා පාලනය සම්බන්ධයෙන් පළාත් ක්‍රීඩා සභාවේද එකඟත්වය ඇතිව අමාත්‍යවරයාට උපදෙස් දීම පිණිස එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයන් සඳහා ක්‍රීඩා සභාව බැගින් පිහිටුවිය හැක්කේය.

දිස්ත්‍රික් ක්‍රීඩා සභා පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුත්තේය.

1. අමාත්‍යවරයාගේ අභිමතය පරිදි දිස්ත්‍රික් ලේකම් හෝ වෙනත් අයෙකු සභාපති ලෙස පත්කල හැකිය.
2. දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරීන් නිල බලයෙන් ලේකම් වරයා වන්නේය.
3. දිස්ත්‍රික් තරුණ සේවා අධ්‍යක්ෂ හෝ ඔහු නම් කරනු ලබන නියෝජිතයෙකු.
4. දිස්ත්‍රික්කය තුල ප්‍රාදේශීය ක්‍රීඩා සභා වලින් පත් කර ගන්නා සභාපති සහ ලේකම්වරු.
5. ප්‍රාදේශීය ක්‍රීඩා සභා මගින් නම් කරනු ලබන ක්‍රීඩා සමාජ නියෝජිතයන් දෙදෙනෙකු.
6. දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් වලින් නම් කරනු ලබන නියෝජිතයෙකු බැගින්.
7. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකු.
8. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී / පොලිස් අධිකාරී/ සහකාර පොලිස් අධිකාරී.

ඉහත සඳහන් සාමාජිකයන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නේය.

## 4 වන කොටස

### පළාත් ක්‍රීඩා සභාව.

(07) 1. ………………………… පළාතේ ක්‍රීඩා සංවර්ධනය වැඩි දියුණු කිරීම හා සැලසුම් කිරීම සඳහා ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා පළාත් ක්‍රීඩා සභාවක් පිහිටුවිය යුත්තේය.

2. සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුත්තේය.

අ. අමාත්‍ය වරයා විසින් පත්කරනු ලබන ක්‍රීඩා විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් දෙදෙනෙකු.

ආ. ක්‍රීඩා අධ්‍යක්ෂවරයා.

ඇ. ක්‍රීඩා විෂය භාර ලේකම්වරයා හෝ ඔහු/ඇය විසින් පත් කරනු ලබන නියෝජිතයෙකු.

ඈ. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන ක්‍රීඩා විෂය භාර නියෝජ්‍ය හෝ සහකාර අධ්‍යක්ෂවරයෙකු.

ඉ. පළාත් පාලන කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරනු ලබන සහකාර කොමසාරිස් වරයෙකු.

ඊ. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙකු.

උ. නියෝජ්‍ය පොලිස්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු.

ඌ. දිස්ත්‍රික් සභාවල සභාපතිවරු සහ ලේකම්වරු.

එ. දිස්ත්‍රික් ක්‍රීඩා සභාවලට නිල බලයෙන් පත් නොවූ වෙනත් සාමාජිකයන් (මෙම නියෝජිතයන් දිස්ත්‍රික් ක්‍රීඩා සභාව විසින් නම් කල යුත්තේය)

ඒ. පළාත් ක්‍රීඩා සංගම්වල නියෝජිතයෙකු බැගින්.

ඔ. පළාත් තරුණ සේවා අධ්‍යක්ෂ යන අයගෙන් පළාත් ක්‍රීඩා සභාව සමන්විත විය යුත්තේය.

3. [illegible] පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ කරගුණ කල යුතුය.

4. සභාපතිවරයා සභාවේ බහුතර කැමැත්ත මත පත්වේ.

5. සභාවට පත්කරනු ලබන සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු තුනකට සීමාවේ. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයකු මිය ගියහොත් හෝ ඉල්ලා අස් වුවහොත් නව සාමාජිකයකු පත් කිරීම අමාත්‍යවරයා විසින් කළ යුතුය. නව සාමාජිකයා එම තනතුරේ රාජකාරි ඉසිලිය යුත්තේ ඉදිරියට ඉතිරිව ඇති කාලය සඳහා පමණි.

08. 1.

09. 1. යම් තැනැත්තෙකු කිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තෙකු ලෙස නිශ්චය කරනු ලැබ සිටියහොත්.

2. කිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තෙකු වශයෙන් නිශ්චය කරනු ලැබුවහොත් හෝ ලැබ සිටියහොත්.

3. චරිත දූෂණාත්මක යම් වරදකට අධිකරණයේ වරදකරු කරනු ලැබුවහොත් හෝ

4. ක්‍රීඩා භාණ්ඩ ක්‍රීඩා අම්පායර හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් නිෂ්පාදනය කිරීමේ හෝ එකතර යෑදීමේ හෝ විකිණීමෙහිලා ගෙලිත්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවක් ඇත්නම් හෝ ඒ තැනැත්තා පළාත් දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ක්‍රීඩා සභාවකට පත් කරනු ලැබීමට නුසුදුසු වන්නේය.

සු/070323.